පන්හිඳයි පින්සලයි



සිසිර දිසානායක

# තිර අතරේ.......

''කාලෙකින් මොනවත් ලියන්න බැරි වුණා...'' පන්හිඳ තමන්ටම කියා ගත්තේ ''ටැබ්'' එක ඇඳේම පැත්තකින් තියන ගමන්. වැඩට ගිහින් ආවම මහන්සියි. ඒ මහන්සිය යන්නේ ඇඟ පත හෝදගෙන, නාගෙන තේ කෝප්පයක් බිව්වම. රෑ කෑම වේල පිළියෙල කරගන්නේ පින්සලයි, පැන්සලයි දෙන්නත් එක්ක. කෑමෙන් පස්සේ තමයි ගල් ලෑල්ලක් වගේ තියෙන පෙති ලෑල්ල නැත්නම් ''ටැබ්ලට්'' එක අතට ගන්නේ ඇඳේ ඇලවෙන ගමන්.

"අපේ දවසම ගතවෙන්නේ මේ එක එක " ස්ක්‍රීන්ස්" එක්ක !. පැන්සල තමනගේ ''ටැබ්'' එකේ ලිය ලියා හිටපු එක නවත්තලා කතා වට එකතු වුණා. ඒ ගමන්ම පෙති ලෑල්ලේ තිරයක් නිව්ලා ගියා.

''උදේ පාන්දර එලාම් එක වදින කොට ඒක නවත්තන ගමන් වෙලාව, කාලගුණය එහෙම බලන්න වෙන්නෙ ''මොබයිල්'' ස්ක්‍රීන් එකෙන්. ගෙදරින් එළියට බැස්සයින් පස්සේ වැඩට යනකල්ම කෝච්චියේ ගත වෙන්නේත් මොබයිල් එකත් එක්ක. එහෙම නැත්තං ටැබ් එකත් එක්ක එහෙමත් නැත්තං ''ලැප් ටොප්'' එකත් එක්ක. ''ඔෆිස්'' එකේදී කොම්පියුටරේට ම දවස ගතයි......" පැන් කියාගෙන ගියා දිගටම.

පෙති ලෑලි, උකුළු පරිගණක, ජංගම දුරකතන, පරිගණක එක්ක පරණ පොතක තියෙන පරණ සුවඳටය. අළුත් පොතක පිටු අතරින් එන අළුත් සුවඳටයි දෙකටම මං කැමතියි. පොතක් අතට අරගෙන පිටුවෙන් පිටුව පෙරල පෙරලා කියවන කොට ලැබෙන සතුට මට නම් දැනෙන්නේ නෑ. එය ''ස්ක්‍රීන්ස්'' වලින්......." පන් කිව්වා.

''ටැබ්'' වලිනුත් පොත් කියවන්න පුළුවන්නෙ දැන්. පිටු පෙරළුව නැතිවට, සුවඳ ආවෙ නැතිවට දැනුම, සතුට ලබන්න බැරිකමක් නැනේ'' පින්සලක් හවුල් වුණා කතාවට.

පින් උන්නේ තමන්ගේ උකුළු පරිගණකයේ ග්‍රැෆික් චිත්‍රයක් ඇඳ ඇඳ කෝකටත් තමන් කරපු නිර්මාණය උකුළු පරිගණකයේ නොමැ කෙන්න ඉතිරි කරලය පින් කතාවට හවුල් වුණේ.

''එහෙමනම් ඇයි මිනිස්සු මේ තරම් පොත් අරගන්නේ ? පොත් සාප්පු පුරවගෙන පොත් විකුණන්නේ අරගන්න හින්දනෙ."

''අරගත්තට කියවනවද කියල කවුද දන්නේ?

''ඒකත් ඇත්ත'' තමන් ගත්ත පොත් වලින් තවමත් කියවන්න නොලැබුණ පොත් ටික වෙනමම තියෙන බව පන්ට මතක් වුණේ එතකොටයි.



''වෙලාවක් නැතිකමත් ප්‍රශ්නයක්...''

''ඒක නම් ඉතින් මොන විදියට කියෙව්වත් තියෙන ප්‍රශ්නක්නේ....''

''ලොකු පොත් බර වැඩියි. වැඩට යනකොට ගෙනියන්න අමාරුයි. බෑග් එකේ ඉඩක් නෑ සමහරවිට.......''

''මං නෑ කියන්නේ නෑ; ඒත් පොඩි පත්තරයක්වත් කෝච්චියේ කිය වන්නේ කීයෙන් කීදෙනාද දැන්. කෝච්චියේ නොමිලේ බෙදපු පත්තරත් නැත්තටම නැති වෙලා....''

පන්හිඳයි, පින්සලයි, පැන්සලයි තුන් දෙනාම ඇඳන් උඩ. පන්ගේ ඇඳේ පෙති ලෑල්ල; නැත්නම් ''ටැබ්ලට්'' එක. පැන්සල අතට ජංගම දුරකතනය ඇවිත්. පින්සලගේ උකුලේ උකුළු පරිඝනය; නැත්තං ''ලැප් ටොප්'' එක.

''අපි මේවට ඇබ්බැහි වෙලා....'' ඒ පින්.

''මොනවත් නිසා නෙවෙයි; පහසුව හන්ද......'' ඒ පැන්.

''ඒකෙන් වෙන්නෙ හැමෝම තිර දිහා බලාගෙන කාලය ගත කරන එක. තමන්ගෙ ළඟින්ම ඉන්න කෙනා ගැනවත් දන්නේ නෑ. තවත් කෙනෙක් ගැන කිසි හැඟීමක් නෑ. එකතු වෙලා වැඩක් කරන්න පුරුද්දක් නෑ. තමන්ගේ වගකීම්, යුතු අයුතු කම් දන්නේ නෑ. හොඳ නරක අඳුන්නේ නෑ. පරිසරය ගැන සංවේදී නෑ. කිසිම රසිකත්වයක් විතරක් නෙවෙයි ක්‍රීඩා ශීලිත්වයක්වත් නෑ. මනසට, කයට, ඕන කරන අභ්‍යාස නෑ. අන්තිමට ඉතිරි වෙන්නෙ මානසික, කායික ලෙඩ්ඩු ටිකක් !" පන් කියාගෙන කියාගෙන ගියේ බොහොම සංවේදීව.

''මේ ළඟදී මං ''ෆේස් බුක්'' එකේ දැක්කා දියේ ගිලිලා මැරෙන්න යන මනුස්සයෙක් වීඩියෝ කරලා දාලා. වීඩියෝ කරපු මනුස්සයා ඒ වැඩේ කරනකල් ඒ මනුස්සයාගේ සුරතල් බල්ලා පීනාගෙන ගිහින් අර ගිලෙන්න ගිය එකකෙනාව බේරා ගන්නවා. හොඳයි, අපිට පීනන්න බෑ කියලා කියමු; තනියම වීඩියෝ කර කර ඉන්න එක පැත්තක තියලා තව අයගේ උදව් ඉල්ලන්නවත් දුවනවානේ. බලා ඉන්න පුළුවන් ද තව මනුස්සයෙක්ව ගිලෙන දිහා ? අර තිරිසනාගේ තියෙන ''මනුස්ස කම''වත් අපේ මිනිස්සු ගාව නැතිවෙලා ගිහින්....!''

''රඟ පෑමක්ද දන්නෙත් නෑ'' පෑන්ට හිනා.

''පුදුමයි විඩීයෝ කරපු එක්කෙනා තමනුත් එතන හිටියා කියලා පේන්නත් එක්ක සෙල්ෆි ක්‍රමයට වීඩියෝ නොරපු එක..........!" පින්ගේ අදහස ඒ.

''ඉස්සර තැනකට ගියාම එතන තියෙන වැදගත්කම, කලාත්මක බව ඉස්මතුවෙන්න පින්තූර ගන්න එකනේ කළේ. දැන් කෙරෙන්නේ තමන් එතෙන්ට ගිය බව පෙන්නන්න ඒ වටපිටාව එන්න තමුන්ගෙම ''සෙල්ෆියක්'' ගන්න එක.

''දැන් කාලේ කට්ටියක් එක්ක ගන්න පින්තූරවලට වඩා තියෙන්නෙ තනියම ගත්ත පින්තූර. ''සෙල්ෆිෂ්'' චින්තනය...!" පැන්සල මහ හයියෙන් හිනා වුණා.

ආත්මාර්තකාමීකමින් පිරුණ ''සෙල්ෆිෂ්'' අයගේ සෙල්ෆි යුගයක් මේක.........!" පින්සලත් ඒ හිනාවට එකතු වුණා.

''මදැයි තිර අතරේ ගතවෙන කාලය එක්ක ලබලා තියෙන කලියුගයක අපූරුව'' පන්හිඳ ''ටැබ්ලට්'' එකේ ''ස්ක්‍රීන් එක වහලා දැම්මා.

තිර අතරේ සෙල්ෆි යුගේ.....!

පන්ට තාලයකට වගේ කියවුණා...

42 වන පිටෙන්

ස්ත්‍රී භාවයේ සහ පුරුෂ භාවයේ වෙනසට පාදක වනුයේ මෙම ලක්ෂණයයි.

ජන්මාණු හටගැනීමේදී සහ ජන්මාණු සංසේචනයකදී මෙම ප්‍රාතිහාර්යය සිදුවී මිනිස් ග්‍රහණයේ පුං (male) සහ ජායා (female) ජීවී අනුපාතය (පිරිමි : ගැහැණු) සමතුලිතාව පවත්වා ගැනෙනුයේ කෙසේද යන්න විමසා බලමු.

පිරිමියාගේ පුං ජන්මානු වන ශුක්‍රාණු හටගන්නේ වෘෂණයේය. ස්ත්‍රියාග් ජායා ජන්මානු වන ඩිම්බ හටගනුයේ ඩිම්බ කෝෂයේය. සාමාන්‍ය සෛල වල වර්ණදේහ යුගල වශයෙන් පැවතියක් ජන්මානු හටගන් නා විශේෂිත ස්ථාන වල එම ක්‍රියාවලිය සිදුවන විට ලිංගික වර්ණදේහ යුගලයේ කොටස් දෙක එකිනෙකින් වෙන්වේ. එනම් පිරිමියාගේ XY යුගලයේ X හා Y වෙන වෙනමත් ස්ත්‍රීයගේ XX යුගලය X සහ X ලෙසත් වෙන් වේ. මෙසේ වෙන්වී ඒවා ජන්මාණු බවට පත්වේ. මේ නිසා පිරිමියෙකු දෙආකාරයක ශුකාණු නිපදවන අතර ස්ත්‍රිය කගේ ඩිම්බ හටගනුයේ එක් ආකාරයකින් පමණකි. මෙය සිදුවන්නේ කෙසේද යන්න ඉහත සටහනේද දක්වා ඇත.

ලිංගික එක් වීමකදී පරිණත ඩිම්බයක්, ශුකාණුවක් මගින් සංසේචනය වීම ඉතාමත් අහඹු ලෙස සිදුවේ. මෙම අහඹු සිදුවීමෙහි ආකාර හතරක් ඉහත සටහනේ දැක්වේ. අවසානයේදි සමස්ත මිනිස් ගහණයම පොදුවේ ගත් කළ ස්ත්‍රී පුරුෂ අනුපාතය 1:1 ලෙස පවතිනුයේ මෙම සංසිද්ධිය නිසාය.

ඕනැම ජීවී ගහණයක පුං සහ ජායා ජීවී සමානුපාතය, රදා පවතින්නේ පුං ජීවියාගේ ලිංගිකතා වර්ණදේහ යුගලයේ Y වර්ණදේහ නිසා බව මෙයින් පැහැදිලිවේ.

ඉහත සඳහන් කළ පරිදි, විවිධ සංකේත වලින් හඳුන්වනු ලබන, මිනිසාගේ ස්ත්‍රී පුරුෂ භාවය සහ අනිකුත් සියලුම ජීවින්ගේ පුං සහ ජායා ලිංගික ස්වාභාවයන්, නොනැසි පවත්වා ගනිමින්, ජෛව ලෝකයේ විවිධත්වය රදා පවතින්නේ, පුං ජීවියාගේ Y සංකේතයෙන් හඳුන්වනු ලබන වර්ණදේහ නිසාය.